

''හලෝ... කොහොමද? අපේ රත්තරං, දඹ රත්තරං ගානට දීපු ටෝක් එක.'' බෙන්තර පාලමේ ඇන්දට පය තබාගෙන ගං පතුල දෙස බලා හුන් බැන්කි මූන්ට චූටි නක්කලේට කීය.

හේ ලැජ්ජාවෙන් ඇඹරුණේය. ''අපේ වයිෆ්කාරයට ආරංචි වුණොත් වස ලැජ්ජාව. මට හිතෙනවා මෙතනින් පහළට පැනල මැරෙන්ට''. ''ඇයි අයියෝ එහේ පොලිටීෂියන්ලාගේ වයිෆ්ල එහෙමද? අන්න ඒකට මෙහේ කට්ටියගේ වයිෆ්ලා.... ඩිවොස් එකක් දාල මෙහෙන් එකක් සෙට් කරගන්න බොස්''. හේ පාලම් අන්දෙන් පය ඉවතට ගත්තේය. පසුදින උදෑසනම ඔහු අපේ කාමරයට ආවේය. ඒ රහස දනගැනීමේ රිසියෙනි. මෙය ඔහුට කියා ඇත්තේ හෝටලයේ කෝකියාය. ''සිලි සිලි බෑග් තුනහතරක් අරන් යුරෝපයේ තුන්හතර වතාවක් හිඟමනේ ගිය හාදයා කියපු කථාව මං මුලදි විශ්වාස කළේ නෑ. දැන් මෑන් එකපාරටම එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට ඇටෑක් කරන්න ගත්තු හින්ද, මට මේක අවිශ්වාස කරන්නත් බෑ'' බැංකි මූන් බූරු ඇඳේ වාඩි වෙමින් කීය. ''ඇත්තද? මේ ලංකාව ලෝකයේ ඓශ්චර්යම රට කරන්න හදනව කියන්නේ?''

'' මිස්ටර් මූන්, ඉස්සෙල්ල මේක තේරුම් ගන්න.'' මම අභිමානයෙන් කීවෙමි. ''ඉස්සර මේ කොම්පඤ්ඤ වීදියේ, මරදානේ, මාළිගාවත්තේ, අරහේ මෙහේ රට පුරාම හිටියේ එඩිතර නිවහල් හෙළයෝ ටිකක්. කෑවේ කොස්, පොල්, අල, බතල, කුරහං. බිව්වේ මවු කිරි. පස්සේ වැල්පෙනෙල කැඳ. මෙහේ අපේ කුවේණි ආච්චි නූල්වලට ඩයි දානකොට ඔහේල හිටියේ හෙලුවෙන්. අපේ හෙළ රජදරුවෝ ලෝහ කඩු, දුනු, තෝමර අරං රජකමට අයියලා, මල්ලිලා, පුතාලා එක්ක ෆයිට් කරද්දී ඕගොල්ලොන් ෆයිට් කළේ ගල්මුල්වලින්. අපේ මුතුන් මිත්තෝ ගින්දර හොයාගෙන උයල කද්දී ඕගොල්ලොන් කෑවේ අමුවෙන්. අපේ රාවණ සීයා සීතා ආච්චි එක්ක දඬුමොනරෙන් නුවරඑළියේ විනෝද වෙන කාලේ ඔය ප්ලේන් හදපු රයිට් සහෝදරවරු අම්මගේ බඩේ තියා, තාත්තගේ පංචස්කන්දෙත් නෑ. ජෝජ් ස්ටීවන්සන්කාරය කෝච්චිය හදන්න හිතන්නත් කලින් අපේ ආච්චිල සීයල එකඑක්කෙනාගේ ඉඟවල්වලින් අල්ලගෙන පේලියට කුචුකුචු ගගා ගම්මැද්දේ කෝච්චි ගියා. එහෙම තාක්‍ෂණයක් අපට තිබුණේ.'' බැන්කි මූන් මුව අයා හිස වනමින් සවන් දෙයි.

''මුළු ලෝකටම බැහැයි කිව්ව ත්‍රස්තවාදියා නැති කළේ කවුද?''

''ෆොන්සේකා'' බැංකිමූන්ට කියැවිණි.

''රෙද්ද'' ඒ කියැවුණේ චූටිටය. ''බොස් ඕවට තමයි විදේශීය කුමන්ත්‍රණ කියන්නේ....'' මම පැහැදිලි කළෙමි. ''මේ ඔක්කොම නැති කෙරුවෙ දේශද්‍රෝහී අසිංහල එන්ජීඕ බලවේග. නමුත් ජාතියේ පිනට හම්බන්තොට මහ පරම්පරාවක් අදත් මුන්ට නැති කරන්න බැරි උනා. අද අපි ජාතියක් හැටියට කොම්පඤ්ඤවීදියේ කොහොම හරි ඉන්නේ ඒ උත්තමයන්ට පින් සිද්ද වෙන්න. තේරුණාද?'' බැන්කි මූන් මුව අයාගෙනම මා දෙස බලාගෙන සිටී.

''අද ඒ විදේශීය බලවේග තිරිඟු පිටි, සිනි, ගෑස්, කිරි පිටි, ඉන්දන හැටියට මේ රටට එන්න පටන් අරන්. අද එතුමා තිරිඟු පිටි මිල නග්ගපු හින්දා හෙට වෙනකොට මුළු රටම එදා වගේ අල, බතල, කුරක්කන්, මවුකිරි, වැල්පෙනෙලවලට සෙට්වේගන යන්න පටන් ගනියි. දැන් කොළඹ හතේ නෝනලාත් පෝච්චි වල මල්ගස් ගලවලා අල, බතල, වැල්පෙනෙල, හාතාවාරිය හිටවන්න පටන් අරන්.''

''ඊළඟට ඉන්දන මිල නැග්ගුවාම, බස් ගාස්තු වැඩි කළාම කන්තෝරුවලට යන එන ගෑනු පිරිමි පයින් යන්න පුරුදු වෙනවා. ඊළඟට ගෑස් මිල වැඩි හින්දා හෙට අනිද්දා හැම ගෙදරකම හැම වේලකටම උයන පිහන කටයුතු වලට යන ඉන්දන පිරිමහ ගන්න ගෙවල් දහය පහළොවකට එක ගෙයක් බැගින් මාරුවෙන් මාරුවට සාමූහිකව උයන ක්‍රමයක් වනිතා කටයුතු භාර ඇමතිතුමිය විසින් හඳුන්වා දෙනවා. මේ නිසා නැවත අපි ඈත අතීතයේ වගේ එක ගෙයි කන ක්‍රමයකට හැඩ ගැහෙනවා. ඉස්සර හෙළයා එක ගෙයි කෑවේ පිරිමි දෙන්නෙක් විතර. මේ වර්තමාන ක්‍රමය අනුව ඒ ගණන දහය පහළොව දක්වා වර්ධනය කරගන්න පුළුවන්.'' බැන්කි මූන්ට ලොකු සතුටක් ඇති විය. ''බස් ගාස්තු වැඩි හින්ද ගෙදර මිනිහා එනකොට රෑ ජාමයත් පහු වෙන හින්ද, එක ගෙයි කනකොට ඉස්සර වගේ අමුඩ ලේන්සුව දොරේ එල්ලං කන්න ඕන නැහැ. ඕන තරං ටයිම් තියෙනවා ඇජස් කරං කන්න'' චූටි බැංකි මූන්ට විස්තර කළේය.

''ඊළඟට වැඩ ඇරිල ගෑනු පිරිමි රෑ 10-12 වෙනකම්ම පාරේ එකට එනකොට හොරු මංකොල්ලකාරයෝ ඒ ජොබ් එක කරගන්න අමතක වෙලා ඒ දිහා බලං ඉන්න පටන් ගන්නවා. එතකොට රටේ අපරාධ අඩුවෙලා යනවා. එතකොට සමාජ ශාලාවල්, කාමර කුලියට දෙන හෝටල් වගේ නරක පොට් නිකම්ම වැහිලා යනවා. ඒකට ධෛර්ය දීමක් හැටියට චම්පික ඇමති වීදි ලාම්පු අලුතින් හයි කිරීමත් නවත්තන්න යනවා.''

''ඊළඟට ඉරිදටයි පෝයටයි ටියුෂන් දීම නැවැත්තුවම දරුවන්ට ටියුෂන් දෙන්න ටියුෂන් මාස්ටර්ලා හොය හොයා යන අම්මලාට ටියුෂන් මාස්ටර්ල හොයන්න ඕන නැහැ. ඒ ගොල්ල ගෙදරටම එන්න ගන්නවා. එතකොට දරුවන් ටියුෂන් ගන්න අතරවාරේ අම්මලාටත් ඉඩකඩ තියෙන හැටියට දුරස්ථ ක්‍රමයකට හරි මිනිහ එනකං යමක් කමක් ඉගෙන ගන්න ලැබෙනවා. ඒ නිසා ගෘහණියන්ගේ දැනුම මිණුමත් වැඩි වෙලා 'පුංචි පහේ මං' වගේ තරගවලට ගිහිං ගානක් හොයා ගන්නත් පුළුවන්.''

''ඊළඟට ඉරිදට ටියුෂන් ගන්න පුරුදු වෙලා ඉන්න කෙල්ලෝ කොල්ලෝ දහම් පාසල් යාමෙන්, ආගම ධර්මෙන් දුරස්ථවෙලා හිටපු උන්ට දහම් සුවය විඳගන්න ලැබෙනවා. සාසනේට මේ හින්දා සාමනේර උන්නාන්සේලා වැඩි වැඩියෙන් බිහි වෙනවා.''

''එතකොට කාර් මිල අඩු කෙරුවේ?'' බැන්කි මූන් ප්‍රශ්න කළේය.

''මේවා රටේ වෙනවද කියල හොයල බලන්නේ පයින් ගිහිල්ලද? ගෙදර මනුස්සයත් නැති එකේ ඇමති, මැති, ලේකම් තුමාල රෑට රෑට ගෙවල්වලට ගිහිං මේ වැඩකටයුතු හරියාකාරව ඉෂ්ඨසිද්ධ වෙනවද කියල හොයන්න වාහන ඕන කරනවා'' මම කීවෙමි. බැංකි මූන් කාමරයෙන් එළියට පැන පිම්මේ යුරෝපයට ගොස් මට දුරකතන පණිවිඩක් දුන්නේ ''මීට පස්සේ ලෝකේ ඓශ්චර්යමත්ම රට යුරෝපය''යි කියමිනි.

# මුදු නොවන අම්මාවරු

## චම්පිකා සේරසිංහ

මවක් හා දරුවෙක් අතර ජීව විද්‍යාත්මක සබඳතාව මුල්කොට ඇතිවන සිතිවිලි සමුදාය අප දකින භෞතික සබඳතා කාලසීමාවට වඩා බොහෝ පැරණි ය. ඇය දරුවන් හා දරුවන් හදාවඩා ගැනීම පිළිබඳව සිහින දකින පූර්ව සමයේ ආරම්භය තෙක් ම එය දිවෙයි. ඇය කාල්පනික මාත්‍රයෙන් දරුවන් නිමවයි, බිහි කරයි, හදා වඩා ගනියි.

### මව හා පියා අතර සබඳකම



දරුවා හා මව අතර සබඳතාව ගොඩනැගෙනු හා සමහම නොවූවත් පිය පාර්ශවය ද දරුවා හා වෙනත් ආකාරයක(දරුවා රඳන භෞතිකය ඔහු නොවන නිසා) සබඳකමක් ගොඩනගා ගනියි. ඒයත් ජීව විද්‍යාත්මක සබඳතාව මුල් කොට ගෙනය.

එහෙත් ඒ මව හා බොහෝ පිටුපසින් ඇය හා එක්ව ගමන් කිරීමෙනි.

### නව ජන්මයක් පිළිබඳ පවුලේ ආකල්පය

මිනිස් දරුවා මිනිස් සමාජයට අගනා සම්පතකි. සැබැවින්ම ඒ, ගැහැණියකගේ හා පිරිමියෙක්ගේ ජීව විද්‍යාත්මක එකතුවක නිසඟ ඵලයක් වුව දෙදෙනා නියෝජනය කරන තෙරක් නැති මිනිස් ජාන සමුදායක සංකීර්ණ සංයුක්තයකි. නිමක් නැති වටිනාකම් තොගයක හිමිකරුවෙකි.

එහෙත් පවත්නා ඒක භාර්යා වෘත පවුලට අනුව මිනිස් දරුවා, හුදු මව-පියා-පවුල වෙනුවෙන් උපන්නෙකි. පරම්පරාව ගෙන යන්නා ය. දේපල වල හිමිකරුවා ය, පවුල ගොඩ නැඟීමට, ඉදිරියට තල්ලු කිරීමට ආධාරකයකි. උපදින්නටත් පෙරම ඔහු දොස්තරෙකි, ඉංජිනේරුවෙකි.

### මවක් දරුවා අහිමි කර ගැනීමට පෙළඹීම

අද පවත්නා පීතෘ මූලික පවුල තුළ නව ජන්මියෙක්ගේ රැකවරණයේ, මූලික හා ආසන්නව ගතහොත් එකම පදනම මව හා පියාය. ඔවුන් දෙදෙනා එක්ව දරුවා සුරකියි හෝ වනසයි. සමාජය හෝ රජය වෙත පැවරෙන්නේ ඉතා සීමිත කාර්යභාරයකි. (උදා: බෙහෙත් එන්නත් කිරීම හෝ බර කිරාදීම වැනි දේ)

මූලික පදනම වන මව හා පියාගේ අන්තර් සබඳතාවේ ගුණාංග මතම, දරුවාගේ රැකවරණ ය තීරණය වන නිසා ම දරුවා අනාරක්ෂිත වීමට ඇති සම්භාව්‍යතාවයද ඉහළ ය. බොරුවෙන් ම යැපෙන වර්තමාන සංකීර්ණ ලාංකීය සමාජය තුළ, මාපිය හදවත් හි ඔවුනොවුන් කෙරේ ආදරය වියැකෙන කල දරුවා ද එයට නිතැතින් ම ගොදුරු වේ. "ආදරය අඩු තැන අඩුපාඩු වැඩියි" යන්න සනාථ කරමින් අසරණ මිනිස් දරුවා අඩුපාඩු වලින් ම සම්පූර්ණ කරයි. දරුවා මහ මග දමා හෝ දරුවාගේ ජීවිතය අවසන් කර හෝ දරුවන් අහිමි කරගන්නා අවාසනාවන්ත මව්වරු බොහෝ විට පවසන, "මොකද්ද වුනේ කියලා මට ම තේරෙන්නේ නෑ... ජීවත් වෙන්න මහක් නැති නිසා ම දරුවා දාලා ගියා....." වැනි සංකීර්ණ ප්‍රකාශ සමාජයක් ලෙස බරපතලව කල්පනාවට ගැනීම ඉතා වැදගත් ය.

පසුගිය කාලයේ මේ තත්වයට ගොදුරු වූ සියලු කාන්තාවන්, එකී ඛේදවාචකයෙන් පසුව කරන ඉහත කී ප්‍රකාශ අතර එක් පොදු සාධකයක් ඇත. ඒ ඔවුන් මුහුණ දුන් සංකීර්ණ සමාජීය හා මානසික ගැටලු හරහා ගොඩ නැගි "අසීමිත තනිකම" ය. ඒ භෞතික හා අධ්‍යාත්මික යන දෙපාර්ශවයෙන් ම ය.

### මිනිස් දරුවා පිළිබඳ සමාජ වගකීම

මිනිස් දරුවා මිනිස් සමාජය වෙනුවෙන් උපන්නෙකි. ඒ පොදු බව ඇයගේ/ඔහුගේ පෞද්ගලිකත්වය සුලු කොට තැකීම, පාගා දැමීම හෝ අහෝසි කිරීම වෙනුවෙන් නොව දරුවාගේ නිසැක වටිනාකම් ඔප් නැංවීම වෙනුවෙනි.

සමාජය තුළ මිනිස් පවුලේ නව සාමාජිකයෙක්, සාමාජිකාවක් ලෙස දරුවාට හිමිවිය යුතු අයිතිය, එනම් මිනිස් හැකියා වටිනාකම් දියුණු කර ගැනීමටත්, එතුළින් එහි ඉහළම ඵලයක් වීමටත් ඇති අයිතිය රැක දීමේ වගකීම අද ලාංකික සමාජය ඉටු කරයි ද? පිළිතුර පැහැදිලිවම 'නැත' යන්නයි.

2010 මාර්තු 25 ලංකාවේ ජාතික පුවත්පතක් වන "ලංකාදීප"ය, "උපන් බිමට නුඹ බර වැඩි නොවුණ කලේ" කීවාට, උපන් බිම කළුතර දී මුහුදට බිලි වූ අමිල සඳරුවන්ගේ බර, එක තඹ දොයිතුවකිනුදු දැරුවේ නැත. "පිහන් බිඳෙන්නේ පිහන් සෝදන්නා අතිනි" යන්න සනාථ කරමින් අහිංසක අමිලගේ සම්පූර්ණ බර ඉසිලූ, හුදෙකලාවෙන් පරිපීඩිත මව වූ මානෙල් ම ඔහුගේ දිවි තොර කළා ය. ඊනියා "ආඩම්බරකාර තාත්තලා" ඔහු හා නොසිටියෝ ය. උපන් බිම ඔහුගේ බර දැරිය යුතුව තිබියදී, එය මහ හැරි නිසා ම ඔහු අසරණයෙක් ලෙස මළේ ය. උපන් බිමේ වරුණ වචනයෙන් නොව ක්‍රියාවෙන් ඔප්පු විය යුත්තකි. මනුෂ්‍යයන් පිළිබඳ උපන් ආදරණීය හැඟීමෙන් ක්‍රියාවට නැගී ඔප්පු විය යුත්තකි.

මෙලෙස අත් හැර දමූ සියලු දරුවන්ගේ ජීවිතවල වගකීම දැරිය යුතුව තිබුණේ අප විසිනි. ලාංකික අපි යුතුකම් ඉටු නොකළ මාපියවරු වෙමු. මේ වගකීම අමිල සඳරුවන්ගේ මව මානෙල් ගේ හෝ බිහිකල සැනින් දරුවා වතුර වළක ගිල් වූ අබ්දූන් රසාන් රොසිලාගේ හෝ තම දරුවා වැසිකිලි වලට දමූ ඇහැලියගොඩ මාහිංගොඩ කුසුමාවතීගේ හෝ අනුරාධපුර බස් නැවතුමේ දරුවා හැර දමා ගිය ත්‍රිකුණාමලේ බිබීගේ හෝ මස්කෙලිය කසල ගොඩ අසල දරුවා අත්හැර දමූ පුෂ්පරාණිගේ හෝ නොව අපේ ය. ඒ නිසාම ඒ වරද නිවැරදි කරගත යුතු නම් ඒ ද, ලාංකික සමාජය ලෙස සාමූහිකව අපි වෙතිනි.

හුදු ආත්මාර්ථයේ ගිලී ප්‍රශ්න විග්‍රහ කිරීමෙන් එය කළ නොහැක. ආත්මාර්ථයට සපුරා විරුද්ධ පළල් සාමූහික හැඟීමක්, ක්‍රියාකාරීත්වයක් තුළ පමණක් අපිට සැබෑ මව්වරු පියවරු විය හැක.

### දරුවන් සැබෑවට ජීවත් කරවීමේ වගකීම

මනුෂ්‍යයන් රෝගීන් බවට පත් කර, ඒ රෝගවලට ධනේශ්වර තෘෂ්ණාවෙන් ම පිළිතුරු සොයමින් ගත කරන දිවිය "ජීවත්වීම" ලෙස නම් කරමින් යන මේ ගමන සැබෑ ජීවත්වීම නොවේ. ලාංකික සමාජය තුළ මිනිස් දිවිය දශමයකින් හෝ අත් විඳීමට නම් අඩුම තරමේ ඒ වගකීමට රජය අවම ලෙස හෝ මැදිහත් විය යුතු ය. හිසට සෙවනක් අහිමි මනුෂ්‍යයන් බෝ කරන, පවුල් කඩා ඉහිරුවා අවතැන් කර මිනිස් සබඳතා පලුදු කර දමන, ආහාර මිල ගණන් සීග්‍රයෙන් ඉහළ නංවන, මානසික සෞඛ්‍ය පිළිබඳ තුට්ටුවකට නොතකන වර්තමාන රජය සම්බන්ධයෙන් සමාජමය වගකීම ද ඉමහත් ය. ඒ වගකීම කරට ගත් බහුතරයක් මාපියවරුන් වේ නම් පමණක් දරුවන් සම්පතක් වනු ඇති. මව්වරු හා දරුවන් අතර සැබෑ අව්‍යාජ සබඳකම එයින්ම සුරැකෙනු ඇති.


**'හරය'ට දායක වන්න.**

වසරකට රු. 240/=.

කොම්පඤ්ඤ වීදිය තැපැල් හලෙන් මාරු කර ගත හැකි පරිදි ඔබේ මුදල් ඇණවුම

කර්තෘ, ''හරය'', 143, කිව් පාර, කොළඹ 02 ලිපිනයට එවන්න. දුර: 011 2430621